රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 20/88

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1988 ජූලි මස 07 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

කාර්ය ස්ථානයකින් මාරුවී යාමේදී ගමන් වියදම් ගෙවීම :
ගෘහ භාණ්ඩ ආදිය ප්‍රවාහනය කිරීම -
ආයතන සංග්‍රහය - XIV වන පරිච්ඡේදය.

කරුණාකර 22:5 උප වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත සඳහන් පරිදි ආදේශ කරන්න.

"22:5 - මෙහි 22:8 වැනි සහ 22:11 වැනි උප වගන්තිවලට යටත්ව හා පහත සඳහන් සීමාවන් ඇතුළත, ගෘහ භාණ්ඩ සහ (බයිසිකලය ඇතුළු) ගමන් බඩු නොමිලේ දුම්රියෙන් ගෙන යාමටත්, බඩු මිටි බැඳීමේ වියදම් සහ අනියම් වියදම් ද දෙකෙළවරෙහිම නිවාසය සහ බඩු බාර ගන්නා දුම්රිය ස්ථානය අතර මෙම භාණ්ඩ ප්‍රවාහනය සඳහා නියම වශයෙන්ම දරන ලද ලොරි කුලියද ලබා ගැනීමටත් නිලධාරියෙකුට හිමිකම ඇත්තේය :

| වැටුප | දුම්රියෙන් නොමිලේ ප්‍රවාහනය කිරීමට ඉඩදෙන උපරිම ගමන් බඩු ප්‍රමාණය. |
|---|---|
| අවුරුද්දකට රු.64800 සහ ඊට වැඩි වැටුපක් ලබන නිලධාරියෙකුට | ටොන් 8 යි |
| අවුරුද්දකට රු.39600 සහ ඊට වැඩි වැටුපක් ලබන නිලධාරියෙකුට | ටොන් 6 යි |
| අවුරුද්දකට රු.26160 සහ ඊට වැඩි වැටුපක් ලබන නිලධාරියෙකුට | ටොන් 4 යි |
| අවුරුද්දකට රු.16800 සහ ඊට වැඩි වැටුපක් ලබන නිලධාරියෙකුට සහ 1979.02.28 දිනට පෙර දුම්රියේ II වැනි පන්තියේ ගමන් කිරීමට හිමිකම තිබූ නිලධාරියෙකුට තමාට පෞද්ගලික වන සේ | ටොන් 2 යි |
| අවුරුද්දකට රු.16800 ට අඩු | ටොන් 1 යි." |

මෙය 1988.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

Siriwardhana
(ඩී.බී.අයි.පී.එස්. සිරිවර්ධන)
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.